# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2013 නොවැම්බර් මස 26 වන අඟහරුවාදා

## බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.40 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අමරසේකර, ශිරන්ත
අම්ජාඩ්, එම්.එම්.එම්.
අල්මේදා, මහේෂ්
අබේරත්න, පී.ඩී.
උඩවත්ත, කීර්ති
උඳුගොඩ, ප්‍රදීප්
එල්ලාවල, ලලිත්
කහටපිටිය, කිත්සිරි
කාරියවසම්, කීර්ති
කාරියවසම්, ලයනල්
කුමරගුරුබරන්, එන්.
කුමාර, ජගත්
කුරුප්පු, කාමල්
කුරුවිටගේ, මහින්ද
කුලරත්න, ලාල්
කොටකදෙනිය, එච්.එම්.ජී.බී.
කොස්තා, ජේම්ස් ප්‍රිම්ලස්
කෝරළගේ, යසපාල
ගමගේ, සලෝචන
ගුණවර්ධනමැතිනිය, කෝකිලා හර්ෂනි
ගුණසේකර, විකුම්
චන්ද්‍රභානු, අධිකාරම්ගේ
චන්ද්‍රරත්න, නිමල්
ජයකොඩි, චන්දන
ජයකොඩි, සිසිර
ජයතිස්ස, නලින්ද
ජයනාත්, ගුණසිරි
ජයසිංහ, ලයනල්
තිලකසිරි, ගාමිණී
ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර
ද සිල්වා, ගාමිණී
ද සිල්වා, ජයන්ත
ද සිල්වා, පියල් නිශාන්ත
ද සිල්වා, සිරිකමල් ෆිලිෂියන්
ද සොයිසා, විජයමුණි සුමිත්
දේවප්‍රිය, ඉසුර
නිසාම්ඩීන්, එම්. අර්ෂාද්
පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන
පාදුක්ක, නිරෝෂන්
පෙරේරා, අ. ශ්‍රීනාත් ම.
පෙරේරා, දයාකාන්ත
පෙරේරා, පෝල්
පෙරේරා, ප්‍රදීප්
පෙරේරා, මෙරිල්
පෙරේරා, ශ්‍රීනාත්
ප්‍රනාන්දු, කිත්සිරි
ප්‍රනාන්දු මැතිනිය, රෝස්
ප්‍රියන්ත, විජිත්
බෙත්මගේ, හෙක්ටර්
මතුගමගේ, සුගත්
මල්ලව, නෙලුක්
මවුජුඩ්, අජ්මාල්
මංචනායක, කිත්සිරි
මැන්දිස්, සුමිත් ලාල්
යූසුෆ්, ඒ.එම්.
රහීම්, එම්.එස්.එම්.
රහුමාන්, මොහොමඩ් මුජිබර්
රාජකරුණා, හර්ෂණ
රාජපක්ෂ, තිලකරත්න
රාජපක්ෂ, දිලිප් කුමාර
රාජපක්ෂ, වරුණ දීප්ති
රාජේන්ද්‍රන්, එස්.
රාම්, පංචරත්නම්
රූපසිංහ, ආනන්ද රංජිත්
රොද්‍රිගු, රන්දීර්
ලංකාතිලක මැතිනිය, අශෝකා
වනිගරත්න, ලලිත්
වර්ණකුමාර, ලලිත්
වරාගොඩ, රෙහෙන්සිරි
වැලිවත්ත, ජනක් දීපාල්
විජේරත්න, උදේන
විජයරත්න, මොරිස්
විජේසුන්දර, ශාලිත
විජේසේකර, රවී
සකළසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන
සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා
සුමනසේකර, සරත් කුමාර
සූරියබණ්ඩාර, ජානක
ෆයිරූස්, මොහොමඩ්
ෆවුසි එම්. නවුසර්
ෆායිස්, මොහොමඩ්

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ගුණරත්න, උපාලි
ජයවර්ධන, නිහාල්
තිලකරත්න, හෂාන්
ද සිල්වා, සේනක දමයන්ත
පතිරණ, සරත්
පීරිස්, නිමල් ආර්.
පෙරේරා, තුෂාර
ලක්තිලක, ශිරාල්
විජේමාන්න, ලක්ෂ්මන්
සරණලාල්, චන්ද්‍රසෝම යූ.ජී.
සිල්වා, අමල්
සෙනෙවිරත්න, රොජර්

## 01. නිවේදනය :

*"2013 ඔක්තෝබර් 08 වන දින සභා සම්මත වූ 2013 අංක 06 දරන බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013 ඔක්තෝබර් මස 30 වන දින අනුමැතිය සටහන් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2013.11.05 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. පළාත් සභාවේ රැස්වීම : මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විවාද දිනයන්

**ජගත් අංගගේ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

*"2013.11.05 වන දින පැවති පළාත් සභා රැස්වීමේදී එළඹුණු සභා සම්මුතියට අනුව 2013 දෙසැම්බර් මස 03, 04, 05 හා 06 යන දිනයන් 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් වන අතර, එම දිනවල වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 04. පළාත් සභාවේ කටයුතු :

**ජගත් අංගගේ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

*"2013.11.05 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී ලද එකඟතාවයට අනුකූලව අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක XI ලෙස සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතුවලට පිවිසීමට පෙරාතුව විෂයය අංක XII ලෙසින් සඳහන් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු නමැති විෂයයේ වැඩ කටයුතු නිමා කළ යුතුය."*

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : කම්කරුවන් බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම ප්‍රමාණවත් කිරීම.

2013.10.22 දින නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය සීනුව නාද කිරීමෙන් පසුව විමසන ලදුව, සභා සම්මත විය.

*"රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුළ සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුළත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුළත්වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වනවිට රජය තීරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් 06 සමත්වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙය රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% කට පමණ සෘජු ලෙසම බලපාන තීන්දුවකි. මන්ද යත්, සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂයය අසමත්වන කණ්ඩායම 50% කට ආසන්නය. එයින් ගම්‍ය වන එක් දෙයක් වන්නේ, රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැතිවීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටින්නේය."*

## 06. ව්‍යාපාර නාම ප්‍රඥප්තිය : රීති

**ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.**

*"2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 32(1) වගන්තිය යටතේ සාදනු ලබන රීති*[1] *අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභිහිමුඛ කරන ලදී.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පූ.භා. 10.25 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.18 ට යළිත් රැස්විය.***

## 07. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2014 වසර වෙනුවෙන්

**ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.**

*"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*අනතුරුව, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2014 වසරේ මුදල් ප්‍රකාශයට අදාළව සිය අයවැය කථාව ඉදිරිපත් කරන ලදී.*[2]

## 08. 2014 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :

**ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.**

*"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

## 09. කල් තැබීමේ යෝජනාව :

**සුනිල් ජයමිණි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව පළාත් සභාව, පූ.භා. 12.40 ට, 2013 දෙසැම්බර් මස 03 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.11.26
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

---

[1] *2013.11.26 දින නිල වාර්තාව බලන්න.*
[2] *2013.11.26 දින නිල වාර්තාව බලන්න.*